දුරකථන / தொலைபேசி / Telephones : 011-2136600, 011-2136650
ලේකම් / செயலாளர் / Secretary : 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax : 011-2876169, 011-2876181
විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail : info@psc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website : www.psc.gov.lk

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
## அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
## OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை
**No. 1200/9, Rajamalwatta Road, Battaramulla**

මගේ අංකය / எனது இல / My No : PSC/LS1/04-01-13 04/2019
ඔබේ අංකය / உமது இல / Your No : NT/03/04/01/02
දිනය / திகதி / Date : 2023.09. 08

ලේකම්,

ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය.

**<u>ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ පොලිස් සහ නියාමන සේවා ගණයේ දුම්රිය ආරක්ෂක සේවයේ උප පරීක්ෂක තනතුර සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය</u>**

උක්ත කරුණ සම්බන්ධව ඔබගේ සමාංක හා 2023.08.03 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ අත්සනින් යුතු ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ පොලිස් සහ නියාමන සේවා ගණයේ දුම්රිය ආරක්ෂක සේවයේ උප පරීක්ෂක තනතුර සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියේ මුල් පිටපත මේ සමග එවමි.

03. මේ පිළිබඳව අදාළ නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, අදාළ බඳවා ගැනීමේ පටිපාටිය වෙබ් අඩවියේ පළ කර ඒ පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසත්, කාරුණිකව දන්වා සිටිමි.

ආර්.එච්.ටී.එස්. හෙට්ටිආරච්චි
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආයතන)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
ලේකම් වෙනුවට.

පිටපත්:

1. දුම්රිය සාමාන්‍යාධිකාරී, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව - කරු. දැ.ගැ.ස.
2. ආයතන අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කරු. දැ.ගැ.ස.

# ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ පොලිස් සහ නියාමන සේවා ගණයේ දුම්රිය ආරක්ෂක සේවයේ උප පරීක්ෂක (පිරිමි) සහ උප පරීක්ෂක (කාන්තා) තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය

01. සම්බන්ධ වන ආයතන

1.1 දෙපාර්තමේන්තුව : ශ්‍රී ලංකා දුම්රිය

යොමු අංකය: GMA/SOR/RS-03 දිනය: 2019.07.31
දිනය: 2023.03.25

1.2 අමාත්‍යාංශය : ප්‍රවාහන අමාත්‍යාංශය

යොමු අංකය : MT/03/04/01/02-03 දිනය : 2019.08.22
දිනය : 2023.04.03

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම

යොමු අංකය : DMS/1142 දිනය : 2014.05.29
යොමු අංකය : DMS/1142/IV දිනය : 2017.10.13
යොමු අංකය : DMS/1142/Vol.VIII T දිනය : 2022.02.08

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය:

යොමු අංකය : EST-2/07/REC/1296 දිනය : 2019.05.17

1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය:

යොමු අංකය : NSCC/02/43/SR - II දිනය : 2019.04.23

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය:

යොමු අංකය : PSC/EST/04-01-43/04/2019 දිනය : 2021.10.13
සංශෝධිත දිනය : 2023.05.31

02. **පත්කිරීම් බලධරයා** :රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද දුම්රිය සාමාන්‍යාධිකාරී

03. **සේවා ගණය පිළිබඳ විස්තර :**

3.1 සේවා ගණය :පොලිස් සහ නියාමන සේවා

3.2 ශ්‍රේණි :අදාළ නොවේ.

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :

දුම්රිය සීමාව තුළ නීතිය හා සාමය සුරකිමින් දුම්රිය දෙපාර්තමේන්තුවේ නිශ්චල, චංචල දේපළ , දුම්රිය මගීන් සහ දුම්රියෙන් ප්‍රවාහනය කරන සියලුම භාණ්ඩ වලට ආරක්ෂාව සැපයීම හා අධීක්ෂණ කාර්යයන් ය

3.4 කාර්යයන් පැවරීම : : ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාව මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

## 04. තනතුරෙහි / තනතුරුවල ස්වභාවය : ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත

(විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතුය.)

## 05. වැටුප්:

5.1 වැටුප් කේත අංකය: RS- 03– 2016

5.2 මාසික වැටුප් පරිමාණය:රු.32, 790-7×370-2×495-25×660-52,870/-

5.3 තනතුරු නාමය, වැටුප් කේත අංකය හා අදාළ මාසික වැටුප් පියවර :-

| අනුමත තනතුරු නාමය | වැටුප් කේත අංකය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය(රු.) |
|---|---|---|---|
| උප පරීක්ෂක | RS- 03–2016 | පියවර 1 | 32,790 |

වැටුප් ගෙවීම හා අදාළ අනෙකුත් කරුණු රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි විධිවිධානයන්ට අනුකූල විය යුතුය.

## 06. සේවා ගණයට අයත් තනතුර / තනතුරු :

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| උප පරීක්ෂක (පිරිමි)<br><br>උප පරීක්ෂක (කාන්තා) | අදාළ නොවේ<br><br>අදාළ නොවේ | 65<br><br>03 | • දුම්රිය දෙපාර්තමේන්තුවේ අපරාධ හා දූෂණ වැළැක්වීමට කටයුතු කිරීම හා එවැනි කරුණු පිළිබඳව ලැබෙන පැමිණිලි සොයා බලා නිසි පියවර ගැනීම.<br>• තම අධීක්ෂණයට ඇතුළත් වන කාර්ය ස්ථාන/කාර්ය මණ්ඩල රාජකාරී කටයුතු අධීක්ෂණය.<br>• දුම්රිය දෙපාර්තමේන්තුවේ ආරක්ෂාවට අදාල රාජකාරී කටයුතු සැලසුම් කිරීම හා ඉහළ නිලධාරීන්ගේ නියෝග ,උපදෙස් අනුව කටයුතු කිරීම දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් හෝ අධිකාරී (දුම්රිය ආරක්ෂක) විසින් හෝ බලය පවරන ලද නිලධාරීන් විසින් වරින් වර පවරනු ලබන රාජකාරී. |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :

උප පරීක්ෂක (පිරිමි) 65
උප පරීක්ෂක (කාන්තා) 03

## 07. බඳවා ගැනීමේ ක්‍රමය :

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන්:

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 30% |
| සීමිත | 70% |
| කුසලතා | අදාළ නොවේ |

7.2 විවෘත බඳවා ගැනීම :

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය : උප පරීක්ෂක

7.2.2 සුදුසුකම් :

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් :සිංහල / දෙමළ භාෂාව, ඉංග්‍රීසි, ගණිතය සහ තවත් විෂයන් එකකට සම්මාන සාමාර්ථයන් සහිතව එක්වරකදී විෂයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) සමත්ව තිබීම.

සහ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී සියලු විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත්ව තිබීම. (පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් 03 කින් එකවර සමත්ව තිබීම ප්‍රමාණවත් වේ.

7.2.2.2 වෘත්තීය සුදුසුකම් :අදාළ නොවේ.

7.2.2.3 පළපුරුද්ද : අදාළ නොවේ.

7.2.2.4 කායික සුදුසුකම්: සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.2.2.5 වෙනත්:

i.ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

ii.අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

iii.පිරිමි උස අඩි 05 යි අඟල් 06 ක් තිබිය යුතුය. (5' 6")
(පාවහන් නොමැතිව)

කාන්තා උස අඩි 05 යා අඟල් 02 ක් තිබිය යුතුය.
පිරිමි සඳහා පපුව අඟල් 32 ක් තිබිය යුතුය.

iv.ඇස් පෙනීම :- ඇස් කණ්නාඩි නොමැතිව "ඒ" 2 දෘෂ්ටි ප්‍රමාණය තිබිය යුතුය.(මෙය එල්.බී.29 අක්ෂි දෘෂ්ටි පරීක්ෂණයෙන් සමත්වීමට යටත්වය.)

v.අයදුම්කරුවන් අවිවාහක විය යුතුය.

vii.තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 7.2.2 සිට 7.2.3 දක්වා වන සියළුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.2.3 වයස :

7.2.3.1 අවම සීමාව: අවු.18 ට නොඅඩු
7.2.3.2 උපරිම සීමාව: අවු. 26 ට නොවැඩි

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය :

ලිඛිත පරීක්ෂණයෙන් සෑම විෂයකටම 40% හෝ ඊට වඩා ලකුණු ලබාගන්නා අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව පුරප්පාඩු ප්‍රමාණය මෙන් පස් (05) ගුණයක් නොඉක්මවන සංඛ්‍යාවක් ශාරීරික යෝග්‍යතාවය සහ මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයට කැඳවනු ලබන අතර එම අයදුම්කරුවන් අතරින් මූලික සුදුසුකම් සපුරා ඇති සහ ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පමණක් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයකට ගෙන්වනු ලැබේ.
යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණු සංඛ්‍යාව ලිඛිත විභාගයෙන් ලබා ගන්නා ලකුණු සංඛ්‍යාව සමඟ එකතු කොට අයදුම්කරුවන් ලබා ගත් මුළු ලකුණු සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.
අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව සඳහා ලබා ගත් මුළු ලකුණු සංඛ්‍යාවේ කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ.

7.2.4.1 ලිඛිත විභාගය :

| විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | 100 | 40 |
| භාෂා හැකියාව | 100 | 40 |

(ඇමුණුම 01 බලන්න)

7.2.4.1.1 පවත්වන බලධරයා : දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලබන ආයතනයක මඟින්

7.2.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාල නොවේ.

7.2.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :අදාල නැත. 04

7.2.4.4 යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය:යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන අවස්ථාවේදී ද සුදුසුකම් පරීක්ෂා කිරීමද සිදු කෙරේ.

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 10 | අදාළ නොවේ |
| 2. නායකත්ව හා වෙනත් ප්‍රජා සේවාවන් | 10 | |
| 3. ක්‍රීඩා කුසලතා | 15 | |
| 4. භාෂා දැනුම හා තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම | 10 | |
| 5. සම්මුඛ පරීක්ෂණයේ දී පෙන්වනු ලබන කුසලතාවය | 05 | |
| මුළු ලකුණු | 50 | |

සටහන :

I. ලිඛිත පරීක්ෂණය හා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා මුළු ලකුණු වල කුසලතා අනුපිළිවෙල අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

II. බඳවා ගැනීම් සිදු කරන අවස්ථාවේදී ඉහත වගුවෙහි දැක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත, යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පටිපාටිය අනුමත කිරීම පත් කිරීම් බලධරයා විසින් සිදු කරනු ඇත.

**7.2.4.4.1 යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා:** දුම්රිය සාමාන්‍යාධිකාරී විසින්

**7.2.4.5. මූලික පරීක්ෂණ:** ලිඛිත විභාගයෙන් සමත් වන නිලධාරීන් අතුරින් මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් මූලික පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. එම පරීක්ෂණයේදී ඉහත 7.2.2 සිට 7.2.3 දක්වා වූ සුදුසුකම් පරීක්ෂා කර බලනු ලැබේ.

7.2.4.5.1 : ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය: දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් පත්කරනු ලබන මණ්ඩලයක් මඟින් අයදුම්කරුවන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයට භාජනය කරනු ලැබේ.

**7.2.5** අයදුම්පත්කැඳවීමේක්‍රමය :රජයේ ගැසට් පත්‍රයේ පළකිරීම හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් පළකිරීම සහ වෙබ් අඩවියේ දැන්වීම් පළ කිරීම මඟින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.3 සීමිත බඳවා ගැනීම :

7.3.1 බඳවාගන්නාශ්‍රේණිය : උප පරීක්ෂක

7.3.2 සුදුසුකම් :

7.3.2.1 අධ්‍යාපනසුදුසුකම් :අදාළ නොවේ.

7.3.2.2 වෘත්තීයසුදුසුකම් :අදාළ නොවේ.

7.3.2.3 පළපුරුද්ද :සැරයන් තනතුරේ අවම වශයෙන් වසර 06 ක සක්‍රිය සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධාරියකු වීම.

7.3.2.4 කායිකසුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.3.2.5 වෙනත් :

(i) භාෂා ප්‍රවීණතාවය සමත්ව තිබීම.

(ii) අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතය

(iii) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 අනුව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.

(iv) අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

(v) සැරයන් තනතුරේ වසර 06 ක් සතුටුදායක මට්ටමේ/ඊට ඉහළ කාර්ය සාධනයක් ලබා තිබීම.

(vi) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.3.3 වයස :අදාළ නොවේ.

7.3.4 බඳවා ගැනීමේ ක්‍රමය : ලිඛිත තරඟ විභාගයක් සහ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක් මගින්.

7.3.4.1 ලිඛිත විභාගය :

| විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| දුම්රිය ආඥා පනත ,අපරාධ නඩු විධාන සංග්‍රහය,දණ්ඩ නීති සංග්‍රහය | 100 | 40 |
| දුම්රිය ආරක්ෂක හමුදා ස්ථාවර නියෝග ,වාණිජ පරිශිෂ්ඨය හා ගබඩාකරණය | 100 | 40 |

74

(ඇමුණුම 02 බලන්න)

7.3.4.1.1 පවත්වන බලධරයා : දුම්රිය සාමාන්‍යාධිකාරී හෝ ඔහු විසින් බලය පවරනු ලබන ආයතනයක් මඟින්

7.3.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාල නොවේ.

7.3.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :අදාල නැත.

7.3.4.4 යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය:

ලිඛිත තරඟ විභාගයෙන් සමත් වන අයදුම්කරුවන්ගේ කුසලතා අනුපිළිවෙල අනුව පුරප්පාඩු සංඛ්‍යාවේ දෙගුණයකට සමාන අයදුම්කරුවන් සංඛ්‍යාවක් යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට යොමු කර විභාගයේ හා යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයෙන් වැඩිම ලකුණු ලබාගත් අනුපිළිවෙල මත අයදුම්පත් කැඳවන අවස්ථාවේ පැවති පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් බඳවා ගනු ලැබේ.

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. ජ්‍යෙෂ්ඨතාවය | 35 | අදාළ නොවේ |
| 2. අතිරේක භාෂා දැනුම | 10 | |
| 3. ක්‍රීඩා කුසලතාවය (සැරයන් තනතුරට පත් වූ පසු ලබාගත් ක්‍රීඩා කුසලතා සඳහා පමණක් ලකුණු ලබාදේ) | 15 | |
| 4. කාර්ය සාධනය හා පළපුරුද්ද | 15 | |
| 5. ප්‍රශංසා හා ත්‍යාග පිරිනැමීම | 20 | |
| 6. සම්මුඛ පරීක්ෂණයේදී පෙන්වනු ලබන කුසලතාවය | 5 | |
| මුළු ලකුණු | 100 | |

සටහන :

I. ලිඛිත පරීක්ෂණය හා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

II. බඳවා ගැනීම් සිදු කරන අවස්ථාවේදී ඉහත වගුවෙහි දැක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත, යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පටිපාටිය අනුමත කිරීම පත් කිරීම් බලධරයා විසින් සිදු කරනු ඇත.

7.3.4.4.1 යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා: දුම්රිය සාමාන්‍යාධිකාරී

7.3.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය :වෙබ් අඩවියේ දැන්වීම් පළකිරීම මඟින් හා අභ්‍යන්තර අයදුම්පත් කැඳවීමේ නිවේදනයක් මඟින් හා දෙසති නිවේදන මඟින්.

7.4. කුසලතා පදනම මත බඳවා ගැනීම : අදාළ නොවේ

## 08. කාර්යක්ෂමතා කඩඉම :

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය / වෘත්තීය පරීක්ෂණය /සහතික පාඨමාලාව/වෙනත් |
|---|---|---|
| තනතුරට අදාළ කාර්යක්ෂමතා කඩඉම | තනතුරට පත්වී වසර 03 ක් ඉක්මවීමට පෙර | ලිඛිත පරීක්ෂණය (ඇමුණුම් 03) |

8.2 කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද : වසරකට දෙවරක්

8.3 කාර්යක්ෂමතා කඩඉම්වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයින් කවුරුන්ද ?

තනතුරට අදාළ කාර්යක්ෂමතා කඩඉම- දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලබන ආයතනයක් මඟින්

## 09. භාෂා ප්‍රවීණතාව :

| භාෂාව | ලබා ගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| 01.රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යකින් සේවයට බැඳුනු සේවකයින් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුල ලබාගත යුතුය. |
| 02. අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට අනුෂංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබාගත යුතුය. |

10. ශ්‍රේණි උසස් කිරීම : අදාළ නොවේ.

11. තනතුරුවලට පත් කිරීම:අදාළ නොවේ.

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නාවූ කොන්දේසි: අදාළ නොවේ

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ:

"සක්‍රිය සේවා කාලය "යනු වැටුප් රහිත නිවාඩු කාලයක් ඇතුළත් නොවන, එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රිය සේවා කාලය ලෙස සැලකිය යුතු යැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන් ද ඇතුළත්, නිලධාරියෙකු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සිටි සේවා කාලය වේ.

14. **ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය :**

සේවා කාලය ගණන් ගනු ලබන්නේ ඒ ඒ තනතුරට පත් කරන ලද දිනය පදනම් කර ගෙනය. එසේ වුවත් අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ තැනැත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේදී අදාළ තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊළඟ ඉහළ වැටුප් පියවරේ තැබීම ද සිදු නොකළ යුතුය.

- බඳවා ගැනීම් පරිපාටිය ක්‍රියාත්මක වන දිනට උප පරීක්ෂක තනතුරුවල ස්ථිර සේවයේ නියුතු නිලධාරීන් RS-03-2016 වැටුප් පරිමාණයේ උප පරීක්ෂක තනතුරට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.
- බඳවා ගැනීම් පරිපාටිය ක්‍රියාත්මක වන දිනට අධි සේවක පදනම මත උප පරීක්ෂක තනතුරේ සේවයේ නියුතු නිලධාරීන් RS-03-2016 වැටුප් පරිමාණයේ අධි සේවක පදනම මත උප පරීක්ෂක තනතුරට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්යය පටිපාටික රීති වල දැක්වෙන කොන්දේසි සහ ආයතන සංග්‍රහයේ විධි විධාන අදාළ වේ.

16. මෙම බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

17. අන්තර්කාලීන විධිවිධාන - අදාළ නොවේ.

| | |
|---|---|
| සකස් කළේ:.......(signature)....... | පරීක්ෂා කළේ:.......(signature)....... |
| (විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා) | (විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා) |
| නම : ජේ. ජේ. ජී. අයිශානි, ප්‍රධාන ලිපිකරු (ශ්‍රේණිය I), දුම්රිය සාමාන්‍යාධිකාරී වෙනුවට | නම : එච්. හසංකා එස්. ටී. කේ. ද සිල්වා, උපපරීක්ෂක සාමාන්‍යාධිකාරී (පරිපාලන), දුම්රිය දෙපාර්තමේන්තුව |
| තනතුර :............................... | තනතුර :............................... |
| දිනය : 2023.07.22 | දිනය : 2023.07.25 |

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ...........................................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : ...........................................

තනතුර : ...........................................

[illegible] කොළඹ 10.

දිනය : 2023/07/26 ........................ නිල මුද්‍රාව: ...........................................

---

යොමු අංකය : MT/03/04/01/02-3

2021.10.13 ............ දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද දුම්රිය දෙපාර්තමේන්තුවේ පොලිස් හා නියාමන සේවා ගණයේ දුම්රිය ආරක්ෂක සේවයේ උප පරීක්ෂක තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ...........................................

නම : ...........................................

ලේකම්

........................................... අමාත්‍යාංශය

එම්. එම්. පී. කේ. මායාදුන්නේ
ලේකම්
ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය
7 වෙනි මහල, සෙත්සිරිපාය (අදියර II)
බත්තරමුල්ල

දිනය : 2023.08.03 ........................ නිල මුද්‍රාව: ...........................................

---

යොමු අංකය : PSC/EST/04-01-43/04/2019

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2021.10.13 දිනැතිව අනුමත කරනු ලැබූ සහ එම කොමිෂන් සභාව විසින් 2023.05.31 දින සංශෝධන ඇතුළත් කර සකස් කරනු ලැබූ දුම්රිය දෙපාර්තමේන්තුවේ පොලිස් හා නියාමන සේවා ගණයේ දුම්රිය ආරක්ෂක සේවයේ උප පරීක්ෂක තනතුරු සඳහා වන මෙම බඳවා ගැනීමේ පටිපාටිය සහතික කරමි.

අත්සන : Maaya ...........................................

නම : ඩබ්ලිව්. එච්. එම්. එම්. සී. කේ. දයාරත්න

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය : 2023.08.31 ........................ නිල මුද්‍රාව : ...........................................

ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක 1200/9, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල

ඇමුණුම 01

විභාගයේ නාම : ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ පොලිස් සහ නියාමන සේවා ගණයේ දුම්රිය ආරක්ෂක සේවයේ උප පරීක්ෂක පිරිමි හා කාන්තා තනතුරට බඳවා ගැනීම සඳහා වන විවෘත ලිඛිත විභාගය.

විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය / විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 50 |
| භාෂා හැකියාව | පැය 02 | 100 | 50 |

විභාගය පවත්වනු ලබන බලධරයා : දුම්රිය සාමාන්‍යාධිකාරි විසින් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්

විභාගය පවත්වනු ලබන්නේ කොපමණ වාර සීමාවකට වරක්ද යන වග : පුරප්පාඩු ඇතිවන්නා වූ අවස්ථාවන්හි

විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ තර්කානුකූල විවරණ සහ විග්‍රහ ශක්තිය, නිවැරදි සිද්ධි අනුමානයන්ට එළඹීමේ හැකියාව, සාමාන්‍ය දැනීම හා බුද්ධිය පිළිබඳව මැනීමක් කිරීම අරමුණු කොට ගෙන ගණිත ගැටළු , සාමාන්‍ය දැනීම හා පරිසරය ආශ්‍රිත ප්‍රශ්න ඇතුළත් ව්‍යුහගත මාදිලියේ ප්‍රශ්න පත්‍රයකි. |
| භාෂා හැකියාව | භාෂාව හැසිරවීමේදී ලබාගත යුතු ව්‍යාකරණ, අර්ථ නිරූපණ, සාරාංශ කිරීම් හා භාෂාව පිළිබඳ අවබෝධය පිළිබඳ මැනීමක් කිරීම අරමුණු කොටගෙන සකසන ලද ව්‍යුහගත හා රචනා මාදිලියේ ප්‍රශ්න පත්‍රයකි. |

සටහන 1: මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යයන්ගෙන් පැවැත්වෙන අතර, අපේක්ෂකයකුට කැමති භාෂා මාධ්‍යයකින් විභාගයට පෙනී සිටිය හැකිය. මෙම විභාගය ප්‍රශ්න පත්‍ර දෙකටම පෙනී සිටිය යුත්තේ එක් භාෂා මාධ්‍යයකින් පමණි. ස්වකීය අයදුම්පතේ විභාග මාධ්‍යය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..............................................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : ඩබ්ලිව්.ඒ.ඩී.එස්. ගුණසිංහ
තනතුර : දුම්රිය සාමාන්‍යාධිකාරි
නිල මුද්‍රාව : ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව කොළඹ 10.

දිනය : 2023 | 07 | 26

ඇමුණුම 02

01.විභාගයේ නම : ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ පොලිස් සහ නියාමන සේවා ගණයේ දුම්රිය ආරක්ෂක සේවයේ උප පරීක්ෂක පිරිමි හා කාන්තා තනතුරට බඳවා ගැනීම සඳහා වන සීමිත ලිඛිත විභාගය.

02.විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රයේ ස්වභාවය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| දුම්රිය ආඥා පනත ,අපරාධ නඩු විධාන සංග්‍රහය, දණ්ඩ නීති සංග්‍රහය | පැය 03 | 100 | 50 |
| දුම්රිය ආරක්ෂක හමුදා ස්ථාවර නියෝග ,වාණිජ පරිශිෂ්ඨය හා ගබඩාකරණය | පැය 03 | 100 | 50 |

03.පවත්වනු ලබන බලධරයා : දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලබන ආයතනයක් මගින්.

04.පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග :පුරප්පාඩු ඇතිවන්නා වූ අවස්ථාවන්හි

05.විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| දුම්රිය ආඥා පනත , අපරාධ නඩු විධාන සංග්‍රහය, දණ්ඩ නීති සංග්‍රහය | දුම්රිය ආඥා පනතේ සියළුම වගන්ති ද අපරාධ නඩු විධාන සංග්‍රහයේ 32 ,136 වගන්ති හා 1 පරිච්ඡේදයද දණ්ඩ නීති සංග්‍රහයේ 89-99 දක්වාත්, 310 සිට 318 දක්වා වගන්ති අදාළ කර ගනිමින් සකසන ලද ව්‍යුහගත හා රචනා මාදිලියේ ප්‍රශ්න පත්‍රයකි. |
| දුම්රිය ආරක්ෂක හමුදා ස්ථාවර නියෝග .වාණිජ පරිශිෂ්ඨය හා ගබඩාකරණය | දුම්රිය ආරක්ෂක හමුදා ස්ථාවර නියෝගවල සියළු පරිච්ඡේදයන්ද, වාණිජ පරිශිෂ්ඨයේ I,II හා Vපරිච්ඡේද හා දුම්රිය ස්ථාන ගිණුම් - වාණිජ පරිශිෂ්ඨයේ 410 සිට 440 දක්වා පරිච්ඡේද ද, දුම්රිය ගබඩා පාලනය හා ගබඩාකරණය, ගබඩා ද්‍රව්‍ය සඳහා මිල ගණන් කැඳවීම,මිලදී ගැනීම,ගබඩා කිරීම සහ නිකුත් කිරීම දක්වා වන කාර්යයන් පිළිබඳව දැනුම මැනබැලීම සඳහා සකසන ලද ව්‍යුහගත හා රචනා මාදිලියේ ප්‍රශ්න පත්‍රයකි. |

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : .............................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : ඩබ්ලිව්.ඒ.පී.එස්. ගුණසිංහ

තනතුර : දුම්රිය සාමාන්‍යාධිකාරී ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව කොළඹ 10.

දිනය : 2023/07/26

නිල මුද්‍රාව: .............................

ඇමුණුම 03

01. විභාගයේ නම : ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ පොලිස් සහ නියාමන සේවා ගණයේ දුම්රිය ආරක්ෂක සේවයේ උප පරීක්ෂක පිරිමි හා කාන්තා තනතුර සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. පරීක්ෂණය පිළිබඳ විස්තර :මෙම කාර්යක්ෂමතා කඩඉම ලිඛිත පරීක්ෂණයකි.

| ප්‍රශ්න පත්‍රයේ ස්වභාවය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| ආයතන සංග්‍රහය | පැය 02 | 100 | 40 |
| දුම්රිය ආඥා පනත , අපරාධ නඩු විධාන සංග්‍රහය හා දුම්රිය ගබඩා පාලනය | පැය 02 | 100 | 40 |

03. පවත්වනු ලබන බලධරයා : දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලබන ආයතනයක් මගින්.

04. පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග :වසරකට දෙවරක්

05. පරීක්ෂණය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ආයතන සංග්‍රහය | ආයතන සංග්‍රහයේ I වන කාණ්ඩයේ<br>XII - නිවාඩු<br>XIII - දුම්රිය බලපත්‍ර<br>XVII - අනුග්‍රහ වාර ප්‍රවේශපත්‍ර<br>XVIII - නිල නිවාස<br>XIX - රජයේ නිවාස<br>XXXIII - නීති උපදෙස් හා නීති ක්‍රියා මාර්ග<br>වැනි පරිච්ඡේද හා ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩය ඇසුරෙන් දැනුම පරීක්ෂා කිරීම සඳහා කෙටි පිළිතුරු හා විස්තරාත්මක පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න පත්‍රයකි. |
| දුම්රිය ආඥා පනත , අපරාධ නඩු විධාන සංග්‍රහය හා දුම්රිය ගබඩා පාලනය | දුම්රිය ආඥා පනතේ සියළුම වගන්ති , අපරාධ නඩු විධාන සංග්‍රහයේ 32,136 වගන්ති හා දුම්රිය ගබඩා පාලනයට අදාළ<br>I. මිල ගණන් කැඳවීම<br>II. මිලදී ගැනීම<br>III. ගබඩා කිරීම<br>IV. නිකුත් කිරීම<br>V. ටෙන්ඩර් ක්‍රියා පරිපාටිය<br>ඇතුළු ඉහත සියළුම ක්ෂේත්‍ර පිළිබඳව දැනුම හා අවබෝධය පරීක්ෂා කෙරෙන ප්‍රශ්න පත්‍රයකි. |

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..........................................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : ඩබ්ලිව්.ඒ.පී.එස්. ගුණසිංහ

තනතුර : දුම්රිය සාමාන්‍යාධිකාරී

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

නිල මුද්‍රාව: කොළඹ 10.

දිනය : 2023 / 07 / 26